**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරිම.

(ආ) දිස්ත්‍රික්කයේ ආගමික හා සංස්කෘතික උරුමයන් සුරැකීමට කටයුතු කිරිම.

(ඇ) දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් කරා ගමන් කිරිමට අවශ්‍ය කටයුතු මෙහෙය වීම.

(ඈ) රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු කරගෙන යෑම.

(ඉ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල අධික්ෂණය හා පරිපාලන කටයුතු කිරිම.

(ඊ) කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය.

(උ) දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ කටයුතු මෙහෙයවිම.

(ඌ) විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුළ කරන කටයුතු මෙහෙයවිම.

(එ) ගිනි අවි හා පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරිම.

(ඒ) ප්‍රාදේශිය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය කළමනාකරණ කටයුතු කිරිම

(ඔ) වත්කම් භාරකාරත්වය හා පාලනය තහවුරු කිරිම.

(ඕ) ජාතික මට්ටමේ උත්සව සංවිධානය කිරිම.

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාල**

(අ) නුවරඑළිය

(ආ) අඹගමුව

(ඇ) වලපනේ

(ඈ) කොත්මලේ

(ඉ) හඟුරන්කෙත

**1.3 විගණන විෂය පථය.**

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ

කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 05 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල මුදල් රෙගුලාසිය |
|---|---|
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341(2) |

| | |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| වාහන ලොග් සටහන් පොත් | මුදල් රෙගුලාසි 1645 |
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) විගණන විමසුම්වලට පිළිතුරු දීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 06 කට 2014 ජුනි 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.43,965,269 ක් විය.

**(ඇ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදන රු.399,225,000 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.382,792,174 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.16,432,826 ක් හෙවත් සියයට 4.1 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 340,875,000 | 328,858,511 | 12,016,489 | 3.5 |
| මූලධන | 58,350,000 | 53,933,663 | 4,416,337 | 7.6 |
| **එකතුව** | **399,225,000** | **382,792,174** | **16,432,826** | **4.1** |

(II) **අයවැය විචලනය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.
- වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 සිට සියයට 61 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

---------------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 24 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් එකතුව රු.1,566,600,779 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.501,990,689 ක් හා රු.654,931,377 ක් වශයෙන් එකතුව රු.1,156,922,066 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.380,115,189 ක් හා රු.29,563,524 ක් වශයෙන් එකතුව රු. 409,678,713 ක්වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 43 ක් හා සියයට 4 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2008 සැප්තැම්බර් 05 දිනැති අංක 21 දරන (නව 2008 ඔක්තෝබර්) සමෘද්ධි කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් කිරිදෙන ගැබිනි මව්වරුන්ට රු.500 ක පෝෂණ මල්ලක් ලබා දීම සඳහා 2013 වර්ෂයේදී එකතුව රු.16,019,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ට අදාලව දැනට ප්‍රතිලාභ නොලබන, සමෘද්ධිලාභීන් නොවන, අඩු ආදායම්ලාභී හා ස්කන්ධ දර්ශකය (BM 1) අගයට අඩු මව්වරුන් 3,518 ක් සඳහා රු.500 බැගින් පෝෂණ මල්ලක් මාස 20 ක් සඳහා නිකුත් කිරිමට අනුමත වී තිබුණත්, පෝෂණ දීමනාව මව්වරුන් 732 ක් සඳහා පමණක් ලබා දී තිබුණි.
- 2012 ජුලි 10 දිනැති අංක 02/2012 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛයෙහි 5.1.2 (2) ඡේදය ප්‍රකාරව වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් පැළ මිලදී ගැනිමේදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත මිලට

පමණක්ම සිදු කළ යුතු බවට දක්වා තිබුණද, ඊට පටහැනිව රු.46,970 ක් වැඩිපුර ගෙවා පැළ මිලදී ගෙන තිබුණි.

- ඉහත චක්‍රලේඛය ප්‍රකාරව පැළ සැපයීම සිදුවන අවස්ථාවලදී ඒ සඳහා ප්‍රවාහන වියදම් ඇතුළත් නොකිරිමටත්, කි.මී.15 කට වඩා වැඩි දුරකින් පිහිටා ඇති පැළ තවානකින් ඇනවුම් කරන විට දිස්ත්‍රික් මිල කමිටුවේ මිළ ගණන් මත ප්‍රවාහන වියදම් දැරිය යුතු බව සඳහන් කර තිබුණත්, ඊට පටහැනිව, වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් මිලදී ගත් පැළ සංඛ්‍යාව මත රු.35,000 ක ප්‍රවාහන වියදමක් කර තිබුණි.

- 2013 මාර්තු 12 දිනැති අංක CDWA/06/03/04/1/2013 දරන ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ ලිපියට අනුව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5 ට අදාල පෙර පාසැල් දරුවන් සඳහා නැවුම් කිරි විදුරුවක් ලබාදිම සඳහා රු.3,828,700 ක මුදලක් ලබා දි තිබුණි. එම මුදලින් 2013 ඔක්තෝබර් 01 දින වන විට රු.1,184,355 පමණක් වියදම් කර ඉතිරි රු.2,644,345 ක් සහ 2013 සැප්තැම්බර් අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා ලැබි තිබුණු රු.1,787,040 ක් 2013 දෙසැම්බර් 31 දින දක්වා නිෂ්ක්‍රියව රඳවාගෙන ආපසු යවා තිබුණි.

- අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන තිබු රු.118,125 ක් වටිනා කෙසෙල් පැළ 945 ක් ප්‍රතිලාභීන්ට ලබාදුන් බවට තහවුරු විගණනයට ඉදිරිපත් නොවිණි.

- අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් හදිසි ආපදාවන්ට ලක්වු පාසැල් සිසුන්ට බෙදා හැරීම සඳහා ලබාදි තිබුණු රු.38,088 ක් වටිනා පාසැල් බෑග් 48 ක් ප්‍රතිලාභින්ට බෙදා දි නොතිබුණි.

- හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් දිවි නැඟුම වැඩ සටහන යටතේ කුකුළු පැටවුන් මිලදී ගැනිමට ලැබුණු රු.868,000 ක මුදල් වැය කර මිලදී ගත් ගම් කුකුළු පැටවුන් පිළිබඳ නියැදි විගණන පරික්ෂාවේදි කුකුළු පැටවුන් 90 ක් ලබාගත් ප්‍රතිලාභින් පරික්ෂා කිරිමේදි රු.20,300 ක් වටිනා පැටවුන් 58 දෙනෙකු මිය ගොස් ඇති බව ප්‍රතිලාභින්ගේ භෞතික පරික්ෂාවේදි ලිඛිත ප්‍රකාශ අනුව තහවුරු විය.

- වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් දිවි නැගුම වැඩ සටහන යටතේ මිලදී ගෙන ප්‍රතිලාභින්ට බෙදා දුන් කුකුළු පැටවුන් 2460 දෙනෙකුගෙන් පැටවුන් 920 කගේ පසු විපරම් වාර්තා පරික්ෂාවේදි රු.222,720 ක වටිනාකමැති කුකුළු පැටවුන් 696 ක් මිය ගිය බව ලිඛිත ප්‍රකාශ අනුව තහවුරු විය. ඒ අතරින් ප්‍රතිලාභින් 42 දෙදෙනෙකු සඳහා කුකුළු පැටවුන් 10 බැගින්, ලබාදුන් සියළුම කුකුළු පැටවුන් මිය ගොස් ඇති අතර,

එම ප්‍රතිලාභින්ට රු.3,000 බැගින් කුඩු සකස් කිරීමට ලබාදුන් මුදලද ඇතුළුව රු.348,720 ක මුදලම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.1,138,993 ක් විය. 2014 අප්‍රේල් 30 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු.1,462,108 ක් වී තිබුණි. ඉන් රු.1,138,993 ක් වූ ශේෂ 2012 අප්‍රේල් 04 දින හා 2013 මැයි 13 දින සිට පැවත එමින් පැවතුණි.

**(ඉ). පොදු තැන්පත් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.100,515,704 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.1,390,706 ක් වූ තැන්පතු 72 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii). නියමිත කාලය ඉක්මවා තිබුණු එකතුව රු.2,009,436 ක රැඳවුම් මුදල් හා වෙනත් කාර්යයන් සඳහා ලැබුණු මුදල්, මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව රජයේ ආදායමට බැර කර නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 26001 | 30,000,000 | 27,025,872 | 18,800,000 | 29,419,182 | 120,000,000 | 66,324,561 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව නිලධාරින් ස්ථාන මාරුවීමෙන් මාස 3 ක් ගත වීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලා ගත යුතු බවට උපදෙස් දී තිබුණද, වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශවලට ස්ථාන මාරු වීම් ලබා ගිය නිලධාරින් 04 දෙනෙකුගේ එකතුව රු.675,378ක් වූ ණය ශේෂ වර්ෂ 01 සිට 19 දක්වා කාල පරාසයක් ගතවී තිබුණද, එම ශේෂ නිරවුල් කර නොතිබුණි.

(ii). ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය අනුව ණය මුදලක් ලබාදී එම මුදල ආපසු ගෙවා අවසන් විමට පෙර විශ්‍රාම ගැන්වූ හෝ සේවය අවසන් වන්නාවූ හෝ නිලධාරින්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 කට අයත් විශ්‍රාම ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු.128,976 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii). ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව වැඩ තහනම් කළ නිලධාරින්ගේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 කට අයත් වැඩ තහනම් කළ නිලධාරීන් 10 දෙනෙකුගෙන් එකතුව රු.491,595 ක හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 07 දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2//3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 3 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 පෙබරවාරි 26 දින වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර තිබුණත් අදාල වර්ෂය තුළදි ඉටුකර ගත යුතු පරමාර්ථ හා ඉලක්කයන් සඳහා වගකිම් දැරිය යුතු නිලධාරින් පැහැදිලිව හඳුනාගෙන එහි ඇතුළත් කර නොතිබුණි.

**1.7 වත්කම් කළමනාකරණය**

වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් කළ නියැදි පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්ෂ 2 ක කාලයක සිට මෝටර් වාහන 3 ක් නිෂ්කාර්යව පැවැතුණි.

(ii). නිල්දණ්ඩාහින්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් සංචාරක බංගලාව සඳහා වෙන්කර තිබූ ගොඩනැගිල්ල වසර 6 ක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ii). සියලුම ලැබීම් හා නිකුත් කිරිම් විධිමත් පරිදි ගණන් තැබිය යුතු වුවද, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරික්ත භාණ්ඩ විෂයයන් 41 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii). මුදල් රෙගුලාසි 751 (1) ප්‍රකාරව රජයේ දෙපාර්තමේන්තුවලට ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවද, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ භාණ්ඩ අයිතම 147 ක් බඩු වට්ටෝරු පොතෙහි ඇතුළත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දි ඇති වත්කම්.**

අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු.5,000,000 ක් වටිනා ගොඩනැගිල්ලක් මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ සම්බන්ධිකරණ කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා මුදාහැර තිබුණි.

**(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරිම.**

වෙනත් ආයතන සතුව තිබුණු සමහර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව කොත්මලේ ප්‍රදේශිය ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරික්ෂණවලදි නිරික්ෂණය විය. විස්තර පහත දැක්වේ

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබු ආයතනය | වත්කම් සංඛ්‍යාව |
|---|---|---|
| (i). ඉඩම් | මහවැලි සංවර්ධන අධිකාරිය. | 01 |
| (ii). ගොඩනැගිලි | -එම- | 02 |

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ එකකට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ බැරකම්වල එකතුව රු. 1,780,423 ක් වී තිබුණි.

## 1.8 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) 182 වන (අධිකාරිය වන) තුවක්කු ආඥා පනතේ 22 (2)(උ) වගන්තිය | - | යම් තැනැත්තෙකු සතුව ඇති ගිනි අවියකට නිකුත් කර ඇති බලපත්‍රයේ වලංගු භාවය අහෝසි වී දින දහයක කාල සීමාවක් තුළ පමණක් එම ගිනි අවිය තම සන්තකයක තබාගත හැකි වුවද, ඉන් පසුව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2013 සැප්තැම්බර් 18 දිනැති අංක MOD/CS3/F/2/2013 දරන ලිපියේ 11 ඡේදය පරිදි කටයුතු කළ යුතු වුවද, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 කට අදාල ගිණිඅවි 7 ක් සඳහා 2014 ජුලි 31 දින වන විටත් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත හා සේවා පනතේ 49 වගන්තිය | - | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකවරු විසින් 2013 වර්ෂයේ වැටලීම් අවස්ථා 54 ක්ද, 2012 වර්ෂය වෙනුවෙන් වැටලීම් අවස්ථා 100 ක් සිදු කර තිබුණු අතර පනතේ සඳහන් නියමයන් කඩකළ පුද්ගලයින්/ආයතන 2012 වර්ෂයේ 41 ක්ද, 2013 වර්ෂයේදී 29 ක්ද වෙනුවෙන් නිශ්චිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 102 හා 756 | - | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත මිනුම් ඒකක ප්‍රමිත හා සේවා අංශයේ 2012 වර්ෂයේ පැවැත්වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව භාණ්ඩ ඒකක 82 ක ඌනතාවයක් පැවැතුණි. 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දින වන විටත් සිදු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 177 | 317,899 | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත මිනුම් ඒකක ප්‍රමිත හා සේවා අංශයේ එකතු කරනු ලැබූ මුදල් දිනපතා ප්‍රේෂණය කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඇ) | 29,851 | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 ක බැංකු ගිණුම්වල නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2008 මාර්තු 26 දිනැති අංක 11/2006(1) දරන චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුයුක්ත නිල වාහන 03 ක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන චක්‍රලේඛය | 117,999 | (i) | දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත සීමාව ඉක්මවා දුරකථන වියදම් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. |
| | 11,385 | (ii) | කොත්මලේ ප්‍රාදේශිය ලේකම් විසින් අනුමත සීමාව ඉක්මවා දුරකථන වියදම් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. |
| (ii) 2004 අගෝස්තු 31 දිනැති අංක 353 (5) දරන චක්‍රලේඛය | 2,370,000 | | වාහන විකිණීමේදි වටිනාකම තක්සෙරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහභාගි කර නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මෝටර් රථ දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරික්ෂකවරුන් සහභාගි කරවා ගෙන වාහන 05 ක් තක්සේරු කර තිබුණි. |

**1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දුර්වලතා.**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු වටිනාකම | ආරම්භ කළ යුතු දිනය | ආරම්භ නොකිරිමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | | |
| කොත්මලේ | 02 | 4,000,000 | - | කාලය ප්‍රමාණවත් නොවිම. |
| අඹගමුව | 14 | 20,163,005 | - | -එම- |
| නුවරඑළිය | 18 | 450,000 | - | ව්‍යාපෘති ක්‍රියාවට නැංවිම නුවරඑළිය ප්‍රාදේශිය සභාව යටතේය |

| | | | | |
|---|---|---|---|---|
| හඟුරන්කෙත | 07 | 700,000 | - | මෙම ව්‍යාපෘතිය අදාල යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීවරුන් විසින්ම සංශෝධනය සඳහා යොමු කර ඇත. 2013 දෙසැම්බර් 31 දින වන විටත් සංශෝධනය අනුමත වී නොතිබුණි. |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම.**

නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණු අවස්ථා අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2013 දෙසැම්බර් 31 දින වන විට වියදම | අතහැර දැමීමට හේතුව |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| තරුණ සංවිධානය සඳහා සංගීත උපකරණ සැපයීම බඹරකැලේ වත්ත නුවරඑළිය | 100,000 | 2013.10.21 | - | මිළ ගණන් කැඳවීමේදී ඉල්ලා ඇති භාණ්ඩවල විස්තර පැහැදිලි නොවූ අතර, ඒ පිළිබඳ ඉල්ලුම්කරුට කිහිප වරක්ම දැන්වූ නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා නොතිබුණි. |
| සංස්කෘතික මධ්‍යස්ථානයේ දෙවන අදියර ඉදිකිරීම- ඔලිම්පියා වත්ත, ඉහළ කොටස | 2,000,000 | 2013.10.02 | - | නිතිමය තත්ත්වයක් හේතුවෙන් මෙම කර්මාන්තයේ පළමු වන අදියරද නිම කර නොතිබුණු අතර, දෙවන අදියර ඉදිකිරීම තාවකාලිකව නවතා ඇත. |

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීම් ප්‍රමාදයන්**

නියැදි පරීක්ෂණවලදි අනාවරණය වූ ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | නිම කළ යුතු දිනය | 2013 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | රු. | | | රු. | |
| නුවරඑළිය | 08 | 13,012,194 | 2013.09.12 | 2013.12.19 | 3,602,486 | කොන්ත්‍රාත් කරුවන් ප්‍රමාද කර ව්‍යාපෘතිය ආරම්භ කිරිම. |
| කොත්මලේ | 02 | 801,500 | 2013.11.14 | 2013.12.25 | - | ඉඩම් අත්පත් කර ගැනිමේ ප්‍රමාදය. |
| අඹගමුව | 37 | 14,066,269 | 2013.10.25 | 2013.12.30 | - | මෙම ව්‍යාපෘති කඳුරට උදානය සංවර්ධන යෝජනා වන අතර, ව්‍යාපෘති නිම කිරිමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම, වර්ෂාවෙන් ඇති වූ බාධා, අමුද්‍රව්‍ය ලබාගැනිමේ දුෂ්කරතා |
| වලපනේ | 14 | 7,900,000 | 2013.12.25 | 2014.03.25 | - | 2013 දෙසැම්බර් මස ව්‍යාපෘති සංශෝධනය විම හා වර්ෂාව |

**1.10 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදි අනාවරණය වූ අධිකාරී බලය නොමැති ගනුදෙනු පහත දැක්වේ.

(අ). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පවිත්‍රතා සේවය සඳහා සීමිත මිල ගණන් ලබාගත් ලංසුකරුවන් අතරින් එක් කම්කරුවෙකුට රු.11,500 ක් වූ ලංසුව පිළිනොගෙන ඊට වැඩි

ලංසුව වූ රු.13,875 ක ලංසුව පිළිගැනීම නිසා එක් කම්කරුවෙකු වෙනුවෙන් රු.2,375 බැගින් කම්කරුවන් 10 දෙනෙකු වෙනුවෙන් මසකට රු.23,750 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගලික සමාගමක් සමඟ කාර්යාලයේ ආරක්ෂක සේවාවන් ලබා ගැනීමේ ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම අනුව මුළු සේවකයින් 10 දෙනෙකු සේවයේ යෙදවිය යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අවට පරිශ්‍රය සඳහා සේවකයන් 8 දෙනෙකු පමණක් සේවයේ යොදවා සේවකයින් 10 දෙනෙකු සඳහා ගෙවීම් කර තිබූ හෙයින්, රු.317,342 ක් වැඩිපුර ගෙවා තිබුණි. .

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් බොල්රෝ ජීප් රථය විධිමත් අනුමැතියකින් තොරව මධ්‍යම පළාත් සභාවට පවරා තිබුණි.

(ඈ) කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කටයුතු සඳහා ස්ථාවර අන්තර් ජාල සම්බන්ධතාවයක් තිබියදි පෞද්ගලික නම්වලින් අන්තර්ජාල ඩොංගල් සම්බන්ධතා මිලදී ගෙන ඒ සඳහා ගෙවා තිබුණු බිල්පත්වල වටිනාකම රු.4,981 ක් වි තිබුණි.

## 1.11 වංචනික ස්වරූපයේ ගනුදෙනු

-------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදි පහත සඳහන් වංචනික ස්වරූපයේ ගනුදෙනු අනාවරණය විය.

(අ). නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2013 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ රු.96,000 ක් වැය කර සෙවිලි තහඩු 48 ක් බෙදා හැර තිබුණි. ගේජ් 26 සෙවිලි තහඩුවක සම්මත බර කි.ග්‍රෑම්. 15 ක් වුවත්, කාර්යාලය විසින් බෙදාහැර තිබුණු සෙවිලි තහඩුවක භෞතික පරික්ෂාවේදි බර කි.ග්‍රෑම් 4 ක් හා 4.3 ක් අතර විය. සම්මත පිරිවිතරයන්ට අනුව සෙවිලි තහඩු මිලදි නොගැනිම නිසා රු.72,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විමධ්‍යගත අයවැය වැඩසටහන 2013 යටතේ ලිදුල ලැමලියර් යු.සි.නිවාස කාණු පද්ධතිය සකස් කිරිම සඳහා සිමෙන්ති මිටි 23 ක් රු.22,080 කට මිලදි ගෙන තිබුණද, මිණුම් පරික්ෂා කිරිමේදි සිමෙන්ති මිටි 10 ක් පමණක් භාවිතා කර ඇති බව තහවුරු වීම නිසා රු.12,480 ක වැඩිපුර ගෙවීමක් නිරික්ෂණය විය.

## 1.12 අනාර්ථික ගනුදෙනු

--------------------

කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පල්දෝරු පද්ධතිය පිරිසිදු කර ගැනිම වෙනුවෙන් නාගරික කොමසාරිස් නුවරඑළිය වෙත රු.5,358 ක් ගලි රථය සඳහා ගෙවා තිබුණි. ගලි රථය එම ස්ථානයට යාමට නොහැකි වීම නිසා වියදම නිෂ්ඵල වි තිබුණි.

**1.13 කළමනාකරණ දුර්වලතා**
**-------------------------**

නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා අනාවරණය විය.

(අ). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 42 ක් පැවතියද ඉන් වාහන 16 ක තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත්ව නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුළ සාක්ෂාත් කර ගැනිමට අදාල ක්‍රියාකාරකම් සියල්ල ක්‍රියාකාරි සැලැස්ම තුළින් පෙන්නුම් කළ යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරි සැලැස්මෙහි වාහන, යන්ත්‍ර, සූත්‍ර හා ගොඩනැගිලි පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරිම්, පුහුණු හා ධාරිතා වර්ධනය ගොඩනැගිලි හා නිර්මාණ ඉදිකිරිම්, යන්ත්‍ර මිලදී ගැනිම වැනි රු.58,350,000 ක මූලධන වියදම් පමණක් ඇතුළත් කර තිබුණි.

(ඇ). නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නඩත්තුව සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් 2010 වර්ෂයේ ලද අභ්‍යන්තර දුරකථන කට්ටල 186 ක් 2014 ජුනි මස දක්වා සවි නොකර ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ඈ). නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ බෙදා හැරිම සඳහා මිලදී ගෙන තිබු රු.854,000 ක් වටිනා භාණ්ඩ අයිතම් 37 ක් විගණන දිනය වූ 2014 ජනවාරි 20 දින වන විටත් ප්‍රතිලාභින්ට බෙදා දී නොතිබුණි.

(ඉ). කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුබද්ධව සේවය කර වැටුප් රහිත නිවාඩු පිට විදේශ ගතව සිටින ග්‍රාම නිලධාරියකු අනුමත විදේශ නිවාඩු කාලය 2013 මැයි 24 දිනෙන් අවසන් හෙයින් 2013 මැයි 09 දින සේවයෙන් ඉල්ලා අස්වීමට ලිඛිතව ඉල්ලිමක් කර තිබුණි. 2013 නොවැම්බර් 11 දින වන විටද ඊට අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බැවින්, අනිවාර්ය සේවා කාලය සේවය කිරිමට අපොහොසත් වීම මත අයකළ යුතු රු.582,800 මුදල අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**1.14 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | | | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | | 32 | 22 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | | 12 | 09 | 03 | - |
| (iii) | ද්විතියක මට්ටම | | 713 | 537 | 176 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | පිළිගැනීමේ නිලධාරි | | | | - |
| | | රියදුරු | 78 | 73 | 12 | 07 |
| | | කා.සේ.සේ. | | | - | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | | -- | 04 | - | 04 |
| | **එකතුව** | | **835** | **645** | **201** | **11** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 201 ක් පිරවීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.